


CED Sri Lanka
Quality Education For All
අධ්‍යාපන සංවර්ධන සන්ධානය

ත්‍රෛමාසික අධ්‍යාපනික පුවත් සඟරාව හතරවන කලාපය 2017 දෙසැම්බර්







# අධ්‍යාපනය, ඉගෙනීම සහ යාවජීව ඉගෙනුම් අවස්ථා

අධ්‍යාපනය හා ඉගෙනීම යන යෙදුම් බොහොමයක් අවස්ථාවන්හි දී අප එකට එක්ව හා සමාන අර්ථයන් ප්‍රකාශ කිරීම සඳහා යොදාගනු ලබයි. කෙසේවෙතත් අධ්‍යාපනය සහ ඉගෙනීම අතර පැහැදිලි වෙනස්කම් පවතී. සාමාන්‍ය ව්‍යවහාරයේ දී අපි ඉගෙනගන්නවා යැයි පවසන්නේ විධිමත් අධ්‍යාපනය ලබන අවධිය ගැන සඳහන් කිරීමේදී ය. පාසල් අධ්‍යාපනය නිම කළ පසුව එසේත් නැත්නම් පළමු උපාධිය සම්පූර්ණ කළ පසුව අපගේ අධ්‍යාපනය ඉගෙනීමේ කටයුතු නිමා කර ඇතැයි උපකල්පනය කරන්නෙමු. එසේ නමුත් අප ඇත්ත වශයෙන්ම අපගේ ඉගෙනීම අවසන් කර තිබේද? නව දැනුම තාක්ෂණය සමග යාවත්කාලීන නොවන්නේ නම් වඩාත් සංකීර්ණ වූ අද සමාජයේ සාර්ථක ජීවිතයක් ගතකළ හැකි ද? සීග්‍රයෙන් වෙනස් වන්නා වූ පරිසර සමාජ ආර්ථික තත්ත්වයන් හමුවේ අපගේ පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා එම තත්ත්වයන් අවබෝධ කර ගැනීමටත් අභියෝග යන්ට මුහුණදීමටත් අපට සිදු වේ. ඒ අනුව අපි දැනුම්වත්ව හෝ නොදැනුවත්ව

**අවිධිමත් අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය හා වැඩිහිටි අධ්‍යාපනය යන්න පිළිබඳව සාමාන්‍ය ව්‍යවහාරයේදී අර්ථ දැක්වෙන්නේ එය ආර්ථික සංවර්ධනය සඳහා මංපෙත් හෙළිකරන්නා වූ රැකියා වෙළඳපොළ හා වෘත්තිය පුහුණු අංශයට වැඩි අවධානයක් යොමු කරන ක්ෂේත්‍රයක් ලෙසට ය.**

ආර්ථික, සමාජීය, සංස්කෘතික අවශ්‍යතා මත අඛණ්ඩ ඉගෙනීමක යෙදී සිටින්නේ යැයි පැවසිය හැකිය. එසේ නමුත් අධ්‍යාපනය හා ජීවිත කාලය පුරා ඉගෙනීම යන සංකල්පයන් පිළිබඳව අප සතුව ප්‍රමාණවත් අවබෝධයක් නොමැති බව පෙනේ.

අධ්‍යාපනය යනු යම් සමාජයක් තම දැනුම සාරධර්ම සහ කුසලතාවන් එක් පරම්පරාවකින් තවත් පරම්පරාවකට සම්ප්‍රේෂණය කිරීමත් ලෙස හැඳින්විය හැකියි. ඉගෙනීම යනු නව දැනුම, කුසලතා සහ සාරධර්ම ලබාගැනීම, ග්‍රහණය කරගැනීම ලෙස සරලව හැඳින්විය හැකිය. අධ්‍යාපනය සහ ඉගෙනීම යන ද්විත්වයම පුද්ගලයාගේ මනසට සහ චරිතයට මහත් බලපෑමත් ඇතිකරනු ලබයි. එසේම ඉගෙනීම යන්න සියලුම පුද්ගලයින් සතුව පවත්නා ජීව විද්‍යාත්මක ආශයයන් හි ගතිලක්ෂණයක් ලෙස ද හැඳින්විය හැකිය. මෙය තවදුරටත් පැහැදිලි කරන්නේ නම් අධ්‍යාපනය ලබා නොදෙන අවස්ථාවන්හි සහ වාතාවරණයන්හි

3 වන පිටුවට

### අපේ දැක්ම

ජාති, ආගම්, කුල, භාෂා, සමාජ සහ ආබාධිත තත්ත්වයන් නොසළකා සියලු දෙනාටම ගුණාත්මක හා සමාන අධ්‍යාපන අවස්ථාවන් සහතික කිරීම.

### අපේ මෙහෙවර

සියලු දෙනාටම ගුණාත්මක සහ සමාන අවස්ථා සහිත අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා සිවිල් සමාජ සංවිධාන හා පුරවැසියන් මැදිහත්වීම පිණිස බලපෑම් කිරීම හා

දිරිගැන්වීම ද අධ්‍යාපනික සංවර්ධනය උසස්ම ප්‍රමිතීන්ගෙන් යුතුව ලබා ගැනීමට සිවිල් සංවිධාන හා පුද්ගලයන් දිරිමත් කිරීම

### අපගේ අරමුණු

1. සැමට ගුණාත්මක හා සම අධ්‍යාපනයකට අවස්ථාවන් සළසන ජාතික හා පළාත් අධ්‍යාපන ප්‍රතිපත්තීන් සිවිල් සමාජ සංවිධානයන්ගේ දායකත්වය ගෙන ඒමට හා ක්‍රියාත්මක කිරීමට බලපෑම් කිරීම සහ එය ප්‍රවර්ධනය කිරීම.
2. හැකි උපරිම මට්ටමින් ජාතික අවශ්‍යතාවන් සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන අයුරින් අධ්‍යාපනය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන ප්‍රතිපත්ති, ප්‍රතිසංස්කරණ සහ සැළසුම් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට බලපෑම් හා පෙළඹ වීම් කිරීම.
3. කිසිවෙකුත් මඟ නොහැරෙන ආකාරයෙන් සහ සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය අන්තර්ගත වන පරිදි අධ්‍යාපන සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය පිණිස සියලුම මට්ටම්වල සිවිල් සංවිධාන කණ්ඩායම්වල සහ ජාලයන්ගේ කුසලතාවන් ශක්තිමත් කිරීම.
4. ගුණාත්මක සහ සාධාරණ අධ්‍යාපනයක් සහතික කිරීම උදෙසා අධ්‍යාපන ප්‍රතිපත්ති, සැලසුම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය කිරීම සහ නිර්දේශයන් සිදු කිරීම.

# අධ්‍යාපන සංවර්ධන සන්ධානය නව සාමාජිකයින් බඳවා ගැනීම

අධ්‍යාපන සංවර්ධන සන්ධානය තම සාමාජික සංවිධාන සංඛ්‍යාව ඉහළ නැංවීමට අපේක්ෂා කරනු ලබයි. අධ්‍යාපන සංවර්ධන ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීව සම්බන්ධ වීමට රුචිකත්වයක් දක්වන සිවිල් සංවිධානවලට සහ පුද්ගලයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය. සාමාජිකත්වය ලබාගැනීම සඳහා පහත දැක්වෙන අවම සුදුසුකම් සපුරාලිය යුතුවේ

- අධ්‍යාපනය සම්බන්ධයෙන් ස්වේච්ඡාවෙන් වැඩකරන පළපුරුදු සංවිධානයක් හෝ පුද්ගලයෙක් විය යුතුය
- සංවිධානයක් නම් රජයේ අදාළ ආයතනයන්හි (දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම්/සමාජ සේවා අමාත්‍යාංශය) ලියාපදිංචි වී තිබිය යුතුය

අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සාමාජිකත්වය පිරිනැමීමේ අවසන් තීරණාත්මක බලය අධ්‍යක්ෂක මණ්ඩලය සතු බව කරුණාවෙන් සලකන්න. වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර දුරකතන අංක 0112887642 ඔස්සේ අප අමතන්න නැත්නම් අපට ලියන්න

**සංස්කාරක සටහන**

මෙහි පළවන ලිපිවල අන්තර්ගත කරුණුවල දැක්වෙන අදහස් සහ මත එම ලිපිවල කතෘවරුන් පෞද්ගලික වශයෙන් දරණ ඒවාය. ඒවායේ අන්තර්ගත කරුණු සහ අදහස් අත්‍යාවශ්‍යයෙන් ම අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ අදහස් නොවන බව කරුණාවෙන් සළකන්න.


අධ්‍යාපන සංවර්ධන සන්ධානය
අංක 439/6A
සුදර්ශන මාවත
නාවල පාර, රාජගිරිය



හඬ සඟරාව උපදේශක මණ්ඩලය
කේ. ඩී. පීරිස් මහතා
වජිර උමගලිය මහතා
සුභද්‍රා රාජසිංහ මහත්මිය
ඒ. ලූර්දුසාමි මහතා


CED Sri Lanka
Quality Education For All
අධ්‍යාපන සංවර්ධන සන්ධානය

1 වන පිටුවෙන්

දී වුව ද පුද්ගලයින්ට අවශ්‍ය නම් ඉගෙනීමට ඉඩ ප්‍රස්ථාවන් තිබේ. ඉගෙන ගැනීමට පුද්ගලයන් විසින් ඒ සඳහා දක්වනු ලබන උනන්දුව දැඩි බලපෑමක් එල්ල කරනු ලබයි. අධ්‍යාපනය දෙනු ලැබුවත් ඉගෙන නොගෙන සිටිය හැකි අතර අධ්‍යාපනය ලබානොදෙන අවස්ථාවන්හි පවා ඉගෙන ගත හැකියි.

ඉගෙනීම යනු අඛණ්ඩව සිදුවන ක්‍රියාවලියකි. පුද්ගලයන් සෑම විටම එනම් උපතේදි සිට මරණය දක්වා ඉගෙනීමත් ලබයි. එනමුත් අධ්‍යාපනය පුද්ගලයින් ඔවුන්ගේ ජීවිතයේ එක් අවස්ථාවකදී ලබාගනී. මේ අනුව අධ්‍යාපනය විධිමත් ක්‍රියාවලියක් වන අතර ඉගෙනීම අවිධිමත් ආකාරයට ද සිදුවන බව පැවැසිය හැකියි. එසේම බොහොමයක් අවස්ථාවන්හිදී අධ්‍යාපනයට යම් ප්‍රමිතීන් මෙවළම් අවශ්‍ය වේ. නමුත් ඉගෙනීම සඳහා මෙවැනි සම්මත ප්‍රමිතීන් හෝ මෙවළම් අත්‍යාවශ්‍ය වන්නේ නැත. ඉගෙනීම අවට පරිසරයෙන් සිදුවේ. මේ අනුව අඛණ්ඩ ඉගෙනීම හෙවත් ජීවිත කාලය පුරා ඉගෙනීම යන්න පුළුල් වශයෙන් ජීවිත අත්දැකීම්වලින් සිදුවන්නා වූ ඉගෙනීමක් ලෙස හැඳින්විය හැකියි. ඉගෙනීම වඩාත් නම්‍යශීලී විවිධාකරයෙන් සහ විවිධ අවස්ථාවන්හි දී ලබාගත හැකිවීම මෙහි පවත්නා විශේෂත්වයයි.

අප ඉගෙනගනු ලබන්නේ කුමකට ද ? මේ ඇසුරෙන් නිර්වචන ගණනාවක් තිබේ. අඛණ්ඩ අධ්‍යාපනය හෙවත් ජීවිත කාලය පුරා ඉගෙන ගැනීම හා සම්බන්ධයෙන් වඩාත් උචිත ආකාරයට යොදාගත හැකි නිර්වචනයක් 1996 වසරේදී ඩෙලර්ස් විසින් ඉදිරිපත් කරන ලදී. "අනාගතය සඳහා අධ්‍යාපනය" යන මෙම නිර්වචනය පදනම් වී ඇත්තේ ඉගෙනීම හා බැඳුණු ප්‍රධාන කරුණු සතරක් මත වන අතර ඒවා මෑතකාලීන අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්හි දී විශාල බලපෑමක් සිදුකර තිබේ. මෙම ප්‍රධාන කරුණු අධ්‍යාපනය ගොඩනගන්නා වූ ප්‍රධාන කුළුණු වශයෙන් මෙහි දී හඳුන්වා දී තිබේ.

එම ප්‍රධාන කුළුණු පහතින් දැක් වේ.

**දැනුම්වත්වීම සඳහා ඉගෙනීම** - ලෝකය සහ එහි පවත්නා සංකීර්ණ තත්ත්වයන් පිළිබඳව වඩාත් හොඳින් අවබෝධ කරගැනීම සඳහා අවශ්‍ය ප්‍රජානක දැනුම හා මෙවළම් සපයාග ැනීම සඳහා සහ අනාගත ඉගෙනුම් සඳහා සුදුසු සහ ප්‍රමාණවත් පදනම් දැමීම සඳහා ඉගෙන ගැනීම.

> ඉගෙනීම යනු අඛණ්ඩව සිදුවන ක්‍රියාවලියකි. පුද්ගලයන් සෑම විටම එනම් උපතේදි සිට මරණය දක්වා ඉගෙනීමත් ලබයි. එනමුත් අධ්‍යාපනය පුද්ගලයින් ඔවුන්ගේ ජීවිතයේ එක් අවස්ථාවකදී ලබාග නී. මේ අනුව අධ්‍යාපනය විධිමත් ක්‍රියාවලියක් වන අතර ඉගෙනීම අවිධිමත් ආකාරයට ද සිදුවන බව පැවැසිය හැකියි.

**වැඩ කිරීම සඳහා ඉගෙනීම** - සමාජයේ සහ ආර්ථික ක්‍රියාකාරකම්වල ඵලදායී ලෙස සහභාගීවීම සඳහා අවශ්‍ය කුසලතා ලබාගැනීම සඳහා ඉගෙනීම.

**තමන් කැමැති පුද්ගලයා බවට පත්වීම සඳහා ඉගෙනීම** - සමාජයේ තමන් වඩාත් කැමැති පුද්ගලයා බවට පත්වීමට අවශ්‍ය හැකියාවන් ඔප් නංවා ගැනීමට, කුසලතා වර්ධනය කරගැනීමට අවශ්‍ය ස්වයං විශ්ලේෂණය සහ සමාජ කුසලතා ලබාගැනීම සඳහා සියලුම අංශවල දක්ෂතාවන් හි හෙබි පරිපූර්ණ පුද්ගලයකු බවට පත්වීමට ඉගෙන ගැනීම.

**සමාජයේ එක්ව ජීවත්වීමට ඉගෙන ගැනීම** - මානව අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම අන්තර් සංස්කෘතික අවබෝධය, අන් අයට ගරු කිරීම සහ සමාජයේ සෑම තලයකම සාමය සහ මානව සම්බන්ධතාවලට ගරු කරමින් පුද්ගලයින්ට සාමයෙන් සහජීවනයෙන් ජීවත් වීමට ඉගෙන ගැනීම

වර්තමානයේ දක්නට ලැබෙන අතිශය විධිමත් සහ න්‍යායාත්මක දැනුමට සීමා වූ විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය තුළින් බිහිවන පුද්ගලයා සීමිත කුසලතාවන් සහිත සමාජය පිළිබඳ පටු දැක්මකින් යුත් අයෙක් බවට පත්වීමත් එතුළින් සමාජ ප්‍රශ්න රාශියක් පැන නැගීමක් පැහැදිලිව නිරීක්ෂණය කළ හැකි වී තිබේ. එසේම මෙම විධිමත් අධ්‍යාපනය ක්‍රමය තුළ රැඳී සිටීමට අසමත් වන පුද්ගලයින් තම අධ්‍යාපනය අතර මගදී අත්හැර දැමීම ප්‍රකටව පෙනෙන කරුණකි. මෙම තත්ත්වය නිසා පුද්ගලයින්ට තම හැකියාවන් කුසලතාවන් ඔප් නංවාගෙන තමන් තුළ පවත්නා විභව ශක්තීන්ගෙන් උපරිම ඵල ලබා ගැනීමට තිබෙන අවස්ථාව අහිමි වේ. යුනෙස්කෝ සංවිධානය විසින් නිකුත් කරන ලද වැඩිහිටියන්ගේ ඉගෙනීම සහ අධ්‍යාපනය පිළිබඳ තෙවැනි ජගත් වාර්තාව - 2017 අනුව අධ්‍යාපන ඉලක්ක කරා ලගා වීම සම්බන්ධයෙන්

රටවල් විශාල සංඛ්‍යාවක් කැපීපෙනෙන ජයග්‍රහන අත්කරගෙන තිබේ. එනමුත් වැඩිහිටියන් මිලියන 758 කට පමණ ඉතා සරල වාක්‍යයක් කියවීමට හෝ ලිවීමට නොහැකි තත්ත්වයක සිටින බවත් මෙම වැඩිහිටියන්ගෙන් මිලියන 115 ක් වයස අවුරුදු 15 - 24 ත් අතර වයස් කාණ්ඩයේ පසුවන බවත් හෙළි වේ. එනමුත් මෙම පුද්ගලයින්ට අවිධිමත් සහ නොවිධිමත් ආකාරයෙන් අධ්‍යාපනය ලැබීමට ඉගෙනුම් අවස්ථා තහවුරු කිරීමට අවස්ථාවන් ලබාදීම හා තහවුරු කිරීම මගින් ඔවුන්ගේ ජීවිත වඩාත් සාර්ථක කරගැනීමට මෙන්ම සමාජ සහ ලෝකයට වඩාත් මෙහෙවරක් ඉටු කිරීමටත් ඔවුන්ට අවස්ථාව සැලසෙනු ඇත.

ජීවිත කාලය පුරා ඉගෙන ගැනීම විධිමත් නොවිධිමත් සහ අවිධිමත් ආකාරයෙන් සිදුවිය හැකිය. විධිමත් සහ නොවිධිමත් අධ්‍යාපනයේ ප්‍රධාන වෙනස්කම වන්නේ එය සිදුවන ස්ථානය මතය. විධිමත් අධ්‍යාපනය මූලික වශයෙන් අධ්‍යාපනය සහ පුහුණුව ලබාදීම සඳහා ස්ථාපිත කර තිබෙන ආයතනවලින් සිදු වේ. එසේම මෙම අධ්‍යාපනය නිශ්චිත කාලරාමු දින වකවානු අනුව සිදු වේ. එසේම මේවායේ දී බොහෝ විට ප්‍රතිඵල සහ සුදුසුකම් ඉලක්ක කරනු ලැබේ. කෙසේ නමුත් නොවිධිමත් අධ්‍යාපනය, අධ්‍යාපනය ලබාදීම ප්‍රමුඛ කාර්යය නොකරගත් ආයතන මගින් සිදු වේ. නොවිධිමත් අධ්‍යාපනය විධිමත් අධ්‍යාපනයට අතිරේකයක් ලෙස ද ක්‍රියාත්මක විය හැකිය. උදාහරණ වශයෙන් ඇතැම් විෂයයන් සඳහා රූපවාහිනී හෝ ගුවන් විදුලි වැඩසටහන් මාර්ගයෙන් උපකාර වැඩසටහන් විකාශය කිරීමේ අවස්ථා දැක්විය හැකිය. මෙයට අමතරව සමාජ මාධ්‍ය හා ජංගම දුරකතන වැනි මාධ්‍යයන්ගෙන් ද නොවිධිමත් අධ්‍යාපන අවස්ථා ප්‍රවර්ධනය කළ හැකිය.

අවිධිමත් අධ්‍යාපනය එහි ස්වභාවය/අරමුණු මගින් වෙන්කර හඳුනාගත හැකියි. මෙය ඕනෑම ස්ථානයක සිදුවිය හැකියි. නමුත් ඒ අනෙකුත් ක්‍රියාවන් හි අතුරු ප්‍රතිඵලයක් ලෙසයි. තවදුරටත් පැහැදිලි කරන්නේ නම් අවිධිමත් අධ්‍යාපනය බොහොමයක් අවස්ථාවන්හි දී සැලසුම් සහගත නොවන අතර ඉගෙනීම යන්න සම්බන්ධයෙන් ඍජු හා පැහැදිලි අවධාරණයක් සිදු නොවේ. විධිමත් සහ නොවිධිමත් අධ්‍යාපනයේ දී ඇගයීම් සිදුවන නමුත් අවිධිමත් අධ්‍යාපනය මැනීමට ඇගයීමට ලක්වන්නේ නැත. එනමුත් මෙමගින් වටිනා කුසලතා දැනුම සහ ආකල්ප වර්ධනය කිරීමට සාර්ථකව යොදාගත හැකිය.

> **අඛණ්ඩ ඉගෙනීම හෙවත් ජීවිත කාලය පුරා ඉගෙනීම යන්න පුළුල් වශයෙන් ජීවිත අත්දැකීම්වලින් සිදුවන්නා වූ ඉගෙනීමක් ලෙස හැඳින්විය හැකියි.**

ලෝකය අද මුහුණ දෙන ගැටලුකාරී තත්ත්වයන්ගෙන් මිදීමට සහ වඩාත් යහපත් හෙට දිනයක් උදාකරලීම සඳහා අධ්‍යාපනය සඳහා ප්‍රවේශවීමේ අවස්ථා වැඩි කරලීමටත් විශේෂයෙන් වැඩිහිටි අධ්‍යාපන ක්ෂේත්‍රය නංවාලීමටත් අවධානය යොමුකළ යුතුව තිබේ.

ජීවිත කාලය පුරා ඉගෙනගැනීම මගින් නිර්මාණශීලීත්වය පූර්වගාමිත්වය සහ ප්‍රතිචාරාත්මක බව පුද්ගලයින් තුළ ස්ථාපිත කළහැකි අතර මෙමගින් සීග්‍රයෙන් වෙනස්වන ලෝකයේ අවශ්‍යතාවයන්ට අනුව හැඩ ගැසෙමින් පශ්චාත් කාර්මික සමාජයකට ඔවුන්ට හුරුවීමට පහත සඳහන් කුසලතාවන් සංවර්ධනය කරගැනීම තුළින් හැකිවේ. ඒවා නම්

- අස්ථාවරත්වය අනාරක්ෂිතභාවය කළමනාකරණය කිරීමට හැකිවීම
- සංස්කෘතීන් උපසංස්කෘතීන් පවුල් සහ ප්‍රජාවන් අතර සන්නිවේදනය වැඩිදියුණු වීම සහ
- සාකච්ඡා මගින් ගැටුම් සමනය කිරීමට හැකියාව ලබාගැනීමයි

යුරෝපා කොමිසම ජීවිත කාලය පුරා අධ්‍යාපනය මගින් පුළුල් හා එකිනෙකට සහාය දක්වන්න වූ අරමුණු සතරක් තිබෙන බව සොයාගෙන තිබේ. ඒවා නම් සක්‍රීය පුරවැසිභාවය, සමාජ අන්තර්කරණය, පෞද්ගලික ජීවිතයේ සාර්ථකත්වය, රැකියාවක් සොයාගත හැකිබව නව තත්ත්වයන්ට හැඩගැසීමට හැකිවීමයි. අවිධිමත් අධ්‍යාපනය නොවිධිමත් අධ්‍යාපනය හා වැඩිහිටි අධ්‍යාපනය යන්න පිළිබඳව සාමාන්‍ය ව්‍යවහාරයේදී අර්ථ දක්වෙන්නේ එය ආර්ථික සංවර්ධනය සඳහා මංපෙත් හෙළිකරන්නා වූ රැකියා වෙළඳපොළ හා වෘත්තීය පුහුණු අංශයට වැඩි අවධානයක් යොමු කරන ක්ෂේත්‍රයක් ලෙසට ය. කෙසේ වෙතත් මෙම යුරෝපා සංගමය විසින් ඉදිරිපත් කර තිබෙන නව සංකල්පය, දෘෂ්ටියට අනුව ජීවිත කාලය පුරා අධ්‍යාපනය යන්න මගින් ආර්ථික සහ වෘත්තීය පුහුණුව සම්බන්ධයෙන් පවත්නා පටු දෘෂ්ටීන් විස්ථාපනය කරනු ලබයි.

ජීවිත කාලය පුරාම ඉගෙන ගැනීම සහ යාවජීව අධ්‍යාපනය යන්න නවතම සංකල්පයන් නොවේ. කෙසේවෙතත් තිරසර සංවර්ධන අරමුණු හෙවත් පශ්චාත් සංවර්ධන න්‍යායය පත්‍රයේ මෙම පුළුල් සංකල්පය එනම් වසර 2030 වනවිට සියලුදෙනාටම අඛණ්ඩ ඉගෙනුම් අවස්ථා තහවුරු කරදීම යථාවක් බවට පත්කර ගැනීම සඳහා ප්‍රමුඛ අවධානයක් ලබාදී ඇත. 2030 අධ්‍යාපන ක්‍රියාකාරකම් වැඩ සැලැස්ම මගින් ඉගෙනුම් අවස්ථා සහ ජීවිත කාලය පුරා අඛණ්ඩව ඉගෙන

ගැනීමේ අවස්ථාවන් ප්‍රවර්ධනය සඳහා උපයෝගී කරගත හැකි විවිධාකාරී වූ උපායයමාර්ග පිළිබඳව අවධාරණය කර තිබේ.

ළමුන් යෞවනයින් සහ වැඩිහිටියන් සඳහා ජීවිත කාලීනව ඉගෙනුම් අවස්ථා තහවුරු කිරීම සඳහා බෙහොමයක් වැඩකටයුතු සිදුකළ යුතුව තිබේ. සැමටම අධ්‍යාපනය පිළිබඳව අවධානයට යොමු වූ සමයේ සියලුම රටවල් විධිමත් අධ්‍යාපනය නංවාලීම සඳහා විශාල වශයෙන් ආයෝජනය කළ නමුත් අවිධිමත් සහ නොවිධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රයන් නොසළකා හැරීමට ලක් කළහ. එනමුත් තරුණයින්ට සහ වැඩිහිටියන්ට අධ්‍යාපන අවස්ථා විශාල වශයෙන් තහවුරු කරන්නේ අවිධිමත් සහ නොවිධිමත් අධ්‍යාපන අංශයයි. බෙහොමයක් රජයයන් නොවිධිමත් අධ්‍යාපනය වැඩසටහන් ක්‍රියාත්මක කරන්නේ ප්‍රජා ඉගෙනුම් මධ්‍යස්ථාන මගින් ය. මේවායින් වැඩි ප්‍රමාණයක් මූලික වශයෙන් වැඩිහිටි සාක්ෂරතාවය සහ පාසල් අධ්‍යාපනයෙන් ඈඳහැලුනු ළමුන් සඳහා නැවත වතාවක් විධිමත් අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක වේ. මෙම නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් සඳහා රජයයන් විසින් ප්‍රමාණවත් මුදලක් වෙන් නොකරන අතර මේවා සංවර්ධන සහාය සපයන නියෝජිතායතන සමග ව්‍යාපෘතින් ලෙසට ක්‍රියාත්මක වේ.

රජයේ නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන්වලට සමාන්තරව රාජ්‍ය නොවන ආයතන විසින් තරුණයින්ට සහ වැඩිහිටියන්ට අධ්‍යාපනය ලබාගැනීමට ඉඩ සැළසීම සඳහා මැදිහත්වීම් ගණනාවක් සිදුකර තිබේ. මේවා වැඩි වශයෙන්ම සිදුකර තිබෙන්නේ ප්‍රවේශ වීමට සීමිත අවස්ථා සහ දුෂ්කර වාතාවරණයන් යටතේ ය. ප්‍රජාව සඳහා වූ අධ්‍යාපන වැඩසටහන්වල ප්‍රමුඛත්වය ගනු ලැබූයේ මෙම අංශයයි. මෙහි දී ඔවුන් සාක්ෂරතාවය, ජීවන කුසලතා සංවර්ධනය, ප්‍රජා සහභාගිත්වය සහ කාන්තාවන් බලගැන්වීම සමගින් ඒකාබද්ධ කර ක්‍රියාත්මක කළහ.

> **ලෝකය අද මුහුණ දෙන ගැටලුකාරී තත්ත්වයන්ගෙන් මිදීමට සහ වඩාත් යහපත් හෙට දිනයන් උදාකරලීම සඳහා අධ්‍යාපනය සඳහා ප්‍රවේශවීමේ අවස්ථා වැඩි කරලීමටත් විශේෂයෙන් වැඩිහිටි අධ්‍යාපන ක්ෂේත්‍රය නංවාලීමටත් අවධානය යොමුකළ යුතුව තිබේ.**

කෙසේ නමුත් ඔවුන් විසින් සිදුකරනු ලැබූ මැදිහත්වීම් එතරම් අගය කිරීමට පිළිගැනීමකට ලක්වූයේ නැති අතර ඒවා රජයේ අධ්‍යාපන පද්ධතියට පරිබාහිරව ක්‍රියාත්මක විය. යාවජීව අධ්‍යාපන අවස්ථා ප්‍රවර්ධනය කරන මෙන් බලපෑම් සිදුකරන මෙම අවස්ථාවේ දී ආන්තිකකරණය වූ ප්‍රජාවන් වෙනුවෙන් ප්‍රතිඵල අත්කර දෙන ආකාරයට මෙම මැදහත්වීම් සිදු කරන මෙන් ඉල්ලා සිටීම කාලීන අවශ්‍යතාවයන් වේ.

රජයේ අධ්‍යාපනය යාවජීව ඉගෙනුම් ක්‍රමයකට පරිවර්තනය කිරීම සඳහා දේශපාලන කැමත්ත ද අවශ්‍ය වේ. මේ සඳහා රජයේ ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ තීරණ ගැනීම් සිදුකරන්නන්ට රජයේ සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමය අඛණ්ඩ ඉගෙනුම් අවස්ථාවන් වෙත ව්‍යාප්ත කිරීම සිදුකළ හැක්කේ කෙසේ ද යන්න පිළිබඳව දැනුම්වත් වීම වටහා ගැනීම වැදගත් වේ. සමහර රටවල්වල අවිධිමත් නොවිධිමත් සහ යාවජීව අධ්‍යාපනය සම්බන්ධ ප්‍රතිපත්තින් පැවැතියත් මේවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් බලවත් අභියෝග රාශියක් පවතී.

ශ්‍රී ලංකාවේ තත්ත්වය පිළිබඳව විමසා බැලීමේ දී පැහැදිලිව පෙනීයන්නේ හොඳින් ස්ථාපිත වූ සහ ශක්තිමත් ව්‍යුහයක් සහිතව ක්‍රියාත්මක වන්නා වූ විධිමත් අධ්‍යාපන ක්‍රමයේ බලපෑම තුළින් නොවිධිමත් හා අවිධිමත් අධ්‍යාපනයට සෘණ බලපෑමක් ඇති වී තිබෙන බවය. මෙයට දශක දෙකකට පමණ පෙර ශ්‍රී ලංකාවේ ද නොවිධිමත් සහ අවිධමත් අධ්‍යාපනයට විහාරස්ථාන, දේවස්ථාන ප්‍රජා සංවර්ධන සංවිධාන මහත් දායකත්වයක් ඉටුකරන ලදී. රාත්‍රී ඉංග්‍රීසි අධ්‍යාපන ආයතන, දේශීය කර්මාන්ත පුහුණු වැඩසටහන් මෙහිලා උදාහරණ වශයෙක් සැළකිය හැකිය. එහිදී අධ්‍යාපන අමාත්‍යාංශය පමණක් නොව වෙනත් දෙපාර්තමේන්තු හා රජයේ ආයතන නොවිධිමත් අධ්‍යාපන අංශය සඳහා වැදගත් දායකත්වයක් ලබාදීමට කටයුතු කළහ. පාසල විධිමත් අධ්‍යාපනයට පමණක් සීමා නොකර එය ප්‍රජා සම්පත් මධ්‍යස්ථානයන් වශයෙක් යොදා ගැනීමේ අවශ්‍යතාවය එදාටත් වඩා අද කැපී පෙනේ. කෙසේවෙතත් වැඩිහිටි අධ්‍යාපනය සහ එහිදී වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායීව යොදාගත හැකි ක්‍රියාමාර්ග හා සම්පත් කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීමට බලධාරීන් කටයුතු කර නොමැත. තිරසර සංවර්ධන අරමුණු අංක 4 අධ්‍යාපනය අරමුණ සාක්ෂාත් කරගැනීම එනම් සියලුදෙනා අන්තර්කරණය වූ සමානාත්මතාවයෙන් යුත් ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම සහ ජීවිත කාලය පුරා අඛණ්ඩ ඉගෙනුම් අවස්ථා තහවුරු කිරීම සඳහා නොවිධිමත් හා අවිධිමත් අධ්‍යාපන ක්‍රම ස්ථාපිත කිරීමත් ප්‍රවර්ධනය කිරීමත් අත්‍යාවශ්‍ය වේ.



# හොඳම පාසල ළඟම පාසලයි

විසි එක්වන සියවසේ අප ජීවත්වන්නා වූ විශ්ව සමාජය අන්තර්කරණයට භාජනය වෙමින් පවත්නා අතර දැනුම හා තොරතුරු තාක්ෂණය විශ්මයජනක ලෙස ප්‍රවර්ධනයට ලක්වෙමින් පවතියි. මෙකී ප්‍රවර්ධනය හඳුනාගෙන ඊට අනුරූපීව ජීවිත හැඩ ගස්වාග නු වස් අපගේ බාල පරපුරට නව දැනුම් සොයා යෑමට මග පෙන්වීම යුගයේ අවශ්‍යතාව වනු ඇත. විධිමත් ආයතනයක් වශයෙන් පාසල තවමත් වැදගත් භූමිකාවක් රංගනය කරනු ලැබුව ද ඉහත කී යුග අවශ්‍යතාව සපුරාලීමට එය කෙතරම් දුරට සමත් වන්නේ දැයි යන්න විවාදයට ලක්ව ඇති බව පෙනේ.

කෙසේවුවද විසි එක්වැනි සියවසේ සිදුවෙමින් පවත්නා ගෝලීයකරණය, තාක්ෂණික විප්ලවය, වැඩ ලෝකයේ සිදුවන විප්ලවීය ප්‍රතිව්‍යුහකරණය, දිනෙන් දින වෙනස්වන දැනුම හා ඉගෙනුම් ආදියට අවධානය යොමුකරමින් විවිධ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදුකිරීමට ඒ ඒ රටවල් පෙළඹී සිටියි. සංවර්ධනය වෙමින් පවත්නා රටක් වශයෙන් ශ්‍රී ලංකාවද නිදහසෙන් පසුව 1972, 1981, 1997 යනාදී වර්ෂ කේන්ද්‍රීය වූ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් විසි එක්වැනි සියවස උදාවත් සමග මේ දක්වා ක්‍රියාත්මක වෙමින් පවත්නා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදුවන්නේ ඉහත කි අභියෝගයන්ට මුහුණ දීමේ පියවරවල් වශයෙනි. මෙකී අධ්‍යාපන පරිවර්තනයේ සමීපතම අධ්‍යාපන සංකල්පය වී ඇත්තේ "ළඟම පාසල හොඳම පාසල" යන්නය.

ඵලදායි පාසලක තිබිය යුතු බහුවිධ සාධක ළඟම හැම පාසලක් වේ නම් මෙය අපරිමිත ගුණයෙන් හෙබි සංකල්පයක් ලෙස නොබියව හැඳින්විය හැකිය. ඵලදායි පාසලක තිබිය යුතු බහුවිධ සාධක අතර සුදස්නයක් (Vision) සහ ඊට අදාළ මෙහෙවරක් (Mission) තිබීම ප්‍රමුඛ වන්නකි. සුදස්නයකින් තොර පාසල විනාශය කරා සමීප වන්නේය. එක ඉත්තක මල් මෙන් උද්යෝගී ගතික පිරිසක් බවට පත්කරමින් එක්සත්ව ඉදිරිය කරා පියවර තබන්නේ සුදස්නය සහ මෙහෙවර කරණකොට ගෙනය. මෙහිදී අදාළ සුදස්නය ආත්මීය කරගැනීම, ඊට කැපවීම, චර්යාමය වෙනස්වීම් ඇතිකර ගැනීම වැදගත් වේ. එබැවින් පාසලක සුදස්නය ලිපිගොනුවක ලේඛනයක් නොව සජීවී ලියවිල්ලක් බව වටහා ගත යුතුය. පාසල් වනාහි සිසුන් මනා ජීවන ශෛලියකට පුරුදු පුහුණු කරවිය යුතු ආයතනයකි. ඒ බව 1967 දී බ්‍රිතාන්‍ය පාසල් සම්බන්ධයෙන් පල කරන ලද ප්ලව්ඩන් (Plowden) වාර්තාවෙන් ද සනාථ වේ. එහි සඳහන් වන්නේ පාසල යනු කතා සාප්පුවක් නොවන බවය. එමගින් ගුණධර්ම හා ආකල්ප සම්ප්‍රේෂණය කළ යුතු බවය. (School is not a talking shop. It must transmit values and attitudes) ඵලදායි පාසලක් සතු බහුවිද සාධක අතර රැකවරණ භාරය (Custodial Function) අධි ශික්ෂණ කාර්යභාරය (Indoctrination) වෘත්තීය භාරය (Vocational Function) හා සහතික ප්‍රදානය ආදියද සම්පූර්ණ විය යුතුය. පාසලක භෞතික පසුබිම ද වැදගත් වේ. පන්සලක් සේ බොහෝ පාසල් පිහිටුවනු ලබන්නේ උස් බිමක සිත්ග න්නා සුළු ඉමහත් ගෞරවණිය හැඟීම් පුබුදුවන පරිදි වූ සුපරිසරයකය. ඉන් ද්වනිත වන්නේ පාසල අනාගත උසස් සමාජයක උල්පත බවයි. නැතහොත් පහන්ටැඹ වන බවය. ඇතැම් තැන්හි යථෝක්ත උත්තරීතරභාවය මිලාන වන සේ අභිමුඛව වෙනත් වාණිජමය ගොඩනැගිලි පිහිටුවා තිබිය හැකිය.

පාසල් ද්වාරයෙන් ප්‍රවිශ්ට වන විට පාසල සම්බන්ධයෙන් යම් හැඟීමක් නිතැතින්ම හට ගැනේ. එසේ ඉවෙන් මෙන් දැනෙන්නේ කුමක් ද? එකී ආයතනයේ සංස්කෘතියයි. එහි අභ්‍යන්තර ආත්මයයි. මේ සඳහා බලපාන්නේ පාසල් පරිශ්‍රයේ ඇති පිළිවෙලයි. පුරාතන අප මාතෘ භූමියේ ප්‍රමුඛ අධ්‍යාපන ආයතනය වූ පිරිවෙන් පුෂ්පාරාම, ඵලාරාමයෙන් සපිරුණු බැව් සංදේශ කාව්‍ය වැනි මූලාශ්‍රවලින් අනාවරණය වේ. එසේ පාසල් පරිසරයද ඵලවැලින් බර රමණීය සෞම්‍ය පරිසරයක් වන්නේ නම් එය ඉගෙනුමට සිත් පහන් කරවන්නකි. මෙහිදී රවීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ උද්‍යාන පාසල් සංකල්පය සිහියට නැගේ. මෙසේ ළඟම පාසල සිසුනට ඉගෙනුම සඳහා පතිරූප පරිසරයක් බිහිකොට තිබීම එම කළමනාකරණයේ ප්‍රමුඛතාවක් වනු ඇත. මෙබඳු සිත්ග න්නා සුළු භෞතික පරිසරයක් පාසලෙහි ගොඩනැගෙන විට එහි සමාජීය, දේශගුණය ප්‍රියමනාප වේ. මේ සඳහා ගුරුවරුන්ගේ යහගුණය මෙන්ම ඉගෙනුම කෙරෙහි සිසුන්ගේ ඇති කැපවීම ද අවශ්‍ය වනු ඇත.

විශිෂ්ට පාසලක් තුළ කිසිඳු සිසුවෙක් කිසිඳු හේතුවක් නිසාවෙන් ප්‍රතික්ෂේප කිරීම සිදුවන්නේ නැත. මෙහිලා 1948 විශ්ව මානව අයිතිවාසිකම් ප්‍රකාශනයේ 26 වගන්තිය මෙන්ම 1959 ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ 28 සහ 29 වගන්ති වෙත අවධානය යොමු කළ යුතු බැව් සිහිකළ යුතු වේ. පාසලක් පිහිටුවා ඇත්තේ ශාස්ත්‍රීය විෂයන් හැදෑරීමටම නොවේ. බහුවිධ නිපුනතාවලින් ශිෂ්‍යයා ශක්තිමත් කිරීමටත්, දෛනිකව ලෝකය අනාවරණය කර ගැනීමටත් ප්‍රජාව තුළ අත්දැකීම් ලැබීමටත් එමගින් අවකාශය සැළසිය යුතු වේ. මෙසේ නොවුණහොත් ශිෂ්‍යයා තමා සිටින ප්‍රජාව තුළම ආගන්තුක වේ. අසරණ වේ.

මහත්මා ගාන්ධිතුමා ප්‍රකාශ කරන්නේ එවිට දරුවාට පරිසරය වැසුණු පොතක් මෙන් වන බවයි. මෙහිලා කියුබානු අධ්‍යාපනඥයෙකු වූ ජෝස් මාර්ති (Jose Marti) ගේ අදහස ද ප්‍රයෝජනවත් වේ. ඔහු පාසල හඳුන්වන්නේ වැඩපොළක් (Workshop) ලෙසය. උදේ වරුවේ උදැල්ලත්, සවස් වරුවේ දී පෑනත් ශිෂ්‍යයාට ලබා දිය යුතු බවයි. මෙබදු පහසුකම් සපයා දීමටත්, ඉන් උපරිම ඵල නෙළා ගැනීමටත් උචිත වන්නේ ළඟම පාසල බව විවාදයක් පැන නොනැගේ.

ඵලදායි පාසලක ඇති තවත් ලක්ෂණයක් වන්නේ පාසල හා දෙමාපිය සම්බන්ධය උසස් මට්ටමක පැවතීමය. ඇත්ත වශයෙන්ම දෙමාපිය වැඩිහිටි ප්‍රජාව පාසල ගැන පමණක් නොව සමස්ථ අධ්‍යාපනය ගැන ප්‍රබුද්ධ අවබෝධයක් ලබා සිටීම අපේක්ෂිතය. පාසල හුදෙකලා දූපතක් නොවේ. දෙමාපියන් ස්වකීය දරුවන්ගේ පාසල පිළිබඳව ගොඩනගා ගත යුත්තේ ධනාත්මක ප්‍රතිරූපයකි. පාසලක අධ්‍යාපනය නැංවිය හැකි වන්නේ එබඳු වාතාවරණයක් තුළිනි. ඉගෙනීම ඉගෙනීම (Learning to Learn) පිළිබඳව සොඳුරු හැඟීමක් සිසුන් තුළ ජනිත කරවීම පාසලේ භූමිකාවයි.

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට සිසුන් හුරුපුරුදු කිරීම ද අධ්‍යාපනයේ සුවිශේෂී කාර්යභාරයකි. 1972 දිවිපැවැත්ම සඳහා ඉගෙනුම (Learning to be) නම් වූ යුනෙස්කෝ වාර්තාවේ එක් මූලික උපකල්පනයක් වූයේ ප්‍රජාතන්ත්‍රවාදය බිහිකර ගැනීමට අධ්‍යාපනය උපයෝගී කරගත හැකි බවයි. ඉන් අනතුරුව 1990 දශකයේ මුල් භාගයේ නිකුත් වූ ඉගෙනීමඃ එහි ඇතුළත ධනය නම් වූ සෙසු වාර්තාවෙන් ද ඒ බව අවධාරණය කොට ඇත.

ඵලදායි පාසලක් සතු මෙබඳු බහුවිධ සාධක පරිපූර්ණ ලෙස ආවරණය කිරීමට සුදුසුම පාසල, ළඟම පාසල බව මනාව ප්‍රතීයමාන වේ. එබැවින් සමස්ත පාසල් පද්ධතියම මේ අයුරින් ඵලදායි පාසල් බවට පත්කර ගැනීමට දරන ප්‍රයත්නයට සාපේක්ෂව "ළඟම පාසල හොඳම පාසලයි" යන සංකල්පය අර්ථදායි වනු ඇත.

**එස් වී පී සිරිසේන**
**විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
**ජාතික අධ්‍යාපන ආයතනය**

# ගුරු දැනුම සිසු මනස වෙත යා කරන අධ්‍යාපන මනෝවිද්‍යාව

ගුරුවරයෙකුට පැවරී තිබෙන කාර්යභාරය පිළිබඳව කරුණු විමසන විට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මනාව ඉටු කිරීමේ වගකීම අතීතයේ පටන් ම ගුරුවරයාට උරුම වී ඇති බව පැහැදිලිව සඳහන් කළ හැකි ය. පුද්ගල ජීවිතයේ අඳුර දුරු කර ආලෝකය දල්වාලිය හැකි එකම පුද්ගලයා ගුරුවරයා බව අමුතුවෙන් කිව යුතු නොවේ. ලොව උපන් සෑම පුද්ගලයෙකුට ම ගුරුවරයෙකු අවශ්‍ය වේ. "**ගුරුන් නැතුව හකුරු කන්නත් බෑ**" යනුවෙන් අපේ ජන වහරේ කියමනක් පවතින්නේත් ගුරු කෙනෙකුන් නොමැතිව කිසිදු ක්‍රියාවක් නිවැරදිව කළ නොහැකි බව තහවුරු කරමිනි. ගුරුවරයෙකුගේ නිවැරදි මඟ පෙන්වීම එතරම් ම පුද්ගල ජීවිතයට අත්‍යවශ්‍ය වන නිසාවෙනි. අප ගෞතම බුදුන් වහන්සේ ගුරුවරයෙකු නොමැතිව බුද්ධත්වය අවබෝධ කර ගත්ත ද බුද්ධත්වයෙන් පසුව උන්වහන්සේ අවබෝධ කර ගත් ධර්මය ගුරුතන්හි තබා ගත් බව සාසන සාහිත්‍යයේ සඳහන් වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිසුන් වෙනුවෙන් ඉගෙනුම් අපේක්ෂණ සැලසුම් කරනු ලබන්නේ ගුරුවරයා විසිනි. ගුරුවරයාට මෙම කාර්යය සාර්ථකව ඉටු කිරීම සඳහා මනෝ විද්‍යාව මහඟු පිටු බලයක් සපයනු ඇත. ශිෂ්‍යයාගේ වයසට, දැනුම් මට්ටමට හා බුද්ධි මට්ටමට සරිලන ආකාරයේ ඉගෙනුම් අපේක්ෂණ සැලසුම් කිරීමට මෙන් ම සිසුන්ගේ චර්යයා රටාවන් නිවැරදිව අවබෝධ කර ගැනීමට ගුරුවරටයකුට අධ්‍යාපන මනෝ විද්‍යාව උපකාරී වේ.

ගුරුවරයා විසින් සැලසුම් කරන ලද ඉගෙනුම් අපේක්ෂණ සාදනය කර ගැනීම සඳහා ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කළ යුතු ය. ගුරුවරයා අපේක්ෂා කරන අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ආකාරයෙන් ඉගෙනුම් අත්දැකීම් සිසුන්ට ලබා දීම සඳහා ද පෙරමන් කියා දෙන්නේ අධ්‍යාපන මනෝ විද්‍යාවයි.

ගුරුවරයා විසින් සංවිධානය කර ලබා දුන්නා වූ ඉගෙනුම් අත්දැකීම් කොතෙක් දුරට සිසුන් තුළ සාදනය වී තිබේ ද යන්න මැන බැලීමේ කාර්ය (ඇගයීමේ ක්‍රියාවලිය) සාර්ථකව සිදු කිරීම සඳහා ද අධ්‍යාපන මනෝ විද්‍යාව ගුරුවරයෙකුට ලබා දෙන ප්‍රේරණය ඉතා වැදගත් වේ.

මේ ආකාරයෙන් කරුණු විමසන විට ගුරුවරයෙකු විසින් ඉටු කරනු ලබන මූලික කාර්යන් වන,

- ★ ඉගෙනුම් අපේක්ෂ සැලසුම් කිරීම.
- ★ ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීම.
- ★ ඉගෙනුම් කාර්යය ඇගයීම.

යන ත්‍රිත්ව ක්‍රියාවලිය සඳහා ම අධ්‍යාපන මනෝ විද්‍යාව උපයෝගී වන බව පැහැදිළි ය. පෙළ පොත, ගුරු මාර්ග උපදේශය, විෂය නිර්දේශය යන සීමාවන් මතින් ශිෂ්‍යා තුළින් නව ඉගෙනුම් අත්දැකීම් සාදනය කිරීමට ගුරුවරයා දරන වෑයම සාර්ථක කිරීම සඳහා අධ්‍යාපන මනෝ විද්‍යාව ලබා දෙන සහය ඉතා අගනේ ය.

දිවි මං තලාවේ යා යුතු මං පෙන්වමින් සුවහසක් සිසුන් යා යුතු මගෙහි නිසි තැනට ම කැඳවා ගෙන යාමට අධ්‍යාපන මනෝ විද්‍යාව ගුරුවරයෙකුට මාර්ග උපදේශකත්වය සදා කල්හි ම සපයනු නියත ය.

**ඩබ්ලිව්.එම්. හර්ෂනී දයානන්ද**
**ශාස්ත්‍රවේදී (ගෞරව)**
**'සහන' ආබාධිතයින් සඳහා වූ සංගමය**
**නොච්චියාගම.**



# ඇඟිලි තුඩින් වැලි පිලේ අකුර කළ අපේ අධ්‍යාපනයේ පෙරළිය

අධ්‍යාපනය රටක පොදු දේපළකි. අධ්‍යාපනය සඳහා රජය ප්‍රතිපාදන වෙන් කරන්නේ නම් එය රටේ සංවර්ධනය උදෙසා කරන අනාගත අයෝජනයක්. දිළිඳුකම, දරිද්‍රතාවය, මෙන්ම සමාජ අසාධාරණයට වැඩි වශයෙන් ගොදුරුවන්නේ නිවැරදි අවබෝධයකින් අධ්‍යාපනය නොලත් පිරිසයි. මේ වන විට අධ්‍යාපන අයිතියක් මෙන්ම අවශ්‍යතා මත පදනම් වූ අත්‍යවශ්‍ය දෙයක් බවට පත් වී ඇත. මේ බව තිරසාර සංවර්ධන අරමුණු අංක 4 මගින් පැහැදිලි කර තිබේ. විශ්වයටම එකම අධ්‍යාපන ප්‍රතිපත්තියක් පිළිබඳව අවශ්‍යතාවය ඇතිවී ඇත.

යහපාලන මූලධර්ම ක්‍රියාත්මක වන රටක අධ්‍යාපනය ඉතාමත් වැගත් සාධකය වී ඇත. යහපාලන මූලධර්ම සමග ගොඩනැගෙන රටක් පවතින තත්ත්වයෙන් පුරවැසියන් වෙනස් විය යුතුයි. ඒ වෙනස් වීම උදෙසා අධ්‍යාපනයේ වෙනස්කම් රටට ගැළපෙන රටේ අනන්‍යතාවය සුරක්ෂිත වන පරිදි ගෝලීයකරණයට අනුව වෙනස් විය යුතුයි.

ආගමික ස්ථාන කේන්ද්‍රීය කර ගනිමින් අපේ රටේ අධ්‍යාපනය මුලින් ආරම්භ වී ඇත. මේ සඳහා බෞද්ධ සිද්ධස්ථාන, ක්‍රිස්තියානි දේවස්ථාන, මුස්ලිම් දේවස්ථාන, හින්දු කෝවිල් මේ රටේ අධ්‍යාපනයේ මූලික ආරම්භක ස්ථාන බවට පත් විය. පසුකාලීනව අධ්‍යාපනික ආයතන වෙන් වෙන් වශයෙන් මේ රටේ ස්ථාපිත වීමත් සමග අධ්‍යාපනයේ විශාල වෙනසක් ඇති විය.

> අධ්‍යාපන අයිතියක් මෙන්ම අවශ්‍යතා මත පදනම් වූ අත්‍යවශ්‍ය දෙයක් බවට පත් වී ඇත. මේ බව තිරසාර සංවර්ධන අරමුණු අංක 4 මගින් පැහැදිලි කර තිබේ. විශ්වයටම එකම අධ්‍යාපන ප්‍රතිපත්තියක් පිළිබඳව අවශ්‍යතාවය ඇතිවී ඇත.

1923 දී ව්‍යවස්ථාදායක සභාව සඳහා තේරී පත් වූ සී.ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නන්ගර මැතිතුමා 1931 සිට 1936 දක්වා වූ කාලය තුළ මේ රටේ අධ්‍යාපන ඇමැතිවරයා ලෙස කටයුතු කරමින් මේ රටේ අධ්‍යාපනයේ විශාල පෙරලියක් සිදු කිරීමට සමත් විය. මේ නිසාම විධිමත් අධ්‍යාපනයක් රට තුළ බිහි විය. නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵලය ඇත ගම්මානවලට පිටිසර ගොවි, කම්කරු කුලී කරමින් ජීවත්වෙන සියලු දෙනාටම නොමිලේ අධ්‍යාපනය ලැබීමේ පහසුකම් ලැබිණි. අඩු වැඩි වශයෙන් තිබෙන සම්පත්වලින් රජයේ අවධානය යොමු කරමින් ඈත ගම්මානවල රජයේ පාසැල් ආරම්භ කිරීමත් එවකට පවත්වගෙන යනු ලැබූ අධ්‍යාපන ආයතන රජයේ අධීක්ෂණයට පත්වීම සිදුවිය.

ගමේ විහාරස්ථානය, දේවස්ථානය මුල් කර ගනිමින් ඇඟිලි තුඩින් අකුරු කළ කාලය අවසන් කරමින් අද තාක්ෂණික මෙවලම් අධ්‍යාපනයට එකතු කර තිබේ. මෙහි සාධනය මෙන්ම රටට නොගැළපෙන කරුණු කාරණ රාශියක් මේ වන විට දෙමාපින්ට විසඳීමට ඉතිරි වෙමින් පවතී. ඒවට වගකිව යුතු කෙනකු මේ වන විට නොමැත. දියුණු රටවල අධ්‍යාපනයේ වෙනස සාදා ඇත්තේ ඒ සඳහා ජාතික ප්‍රතිපත්තියක් රට තුළ ක්‍රියාත්මක කිරීමෙන් නමුත් අපේ රට තුළ අධ්‍යාපනයට ජාතික ප්‍රතිපත්තියක් නොමැති නිසා මේ වන විට පාසැල් දරුවා අසරණ තත්ත්වයට පත්වෙලා. නගරයේ පාසැල්වල ඇති පහසුකම් ග්‍රාමීය හා වතුකරයේ නැහැ. ඒවා සම්පූර්ණ කිරීම සඳහා විධිමත් සැලැස්මක් ද නැත. වරින්වර වෙනස් වන ආණ්ඩු විසින් ගෙනෙන ලද අණපනත්වලින් ක්‍රියාත්මක වන

අධ්‍යාපනයක් අපේ අවසනාවට අපට ඇත. මෙය ගෝලීයකරණය තුළ ගොඩනැගෙන යහපාලන මුලධර්ම ප්‍රවර්ධනය වන අපේ රටට වැදගත් නැහැ. මේ නිසා රජයත් ළමුන්ගේ භාරකරුවනුත් මේ වන විට අසරණ තත්ත්වයට පත් වී ඇත. බරටබරේ පොත් ගොන්නක් බහා ලූ බෑගයක් ඔසවාගෙන යන සිසුන් පිරිසක් ඇති අධ්‍යාපන ක්‍රමයක් අපේ රටතුළ ක්‍රියාත්මක වේ. තාක්ෂණය තුළින් මේ බර සැහැල්ලු කිරිමට යෝජනා වෙමින් පවති. නමුත් මෙම තාක්ෂණය යහපත් ලෙස අධ්‍යාපනයට යොමුකර ගැනීමට අපේ ශිෂ්‍ය ශිෂ්‍යායන්වන් වෙනස් වී තිබේ ද යන්න දෙතුන් වරක් දෙමාපියන්ට හා වගකිව යුතු අයට සිතන්නට කාලය පැමිණ ඇත. රූපවාහිනිය තාක්ෂණයේ ප්‍රතිඵලයකි. මේ වනවිට අධ්‍යාපනයට රූපවාහිනිය අභියෝග යක් වී ඇති බව සමාජ සමීක්ෂණවලින් පැහැදිලි වේ. තාක්ෂණය භාවිතය ගෝලීය අධ්‍යාපනයට ඉතාම වැදගත් නමුත් මේ සඳහා පවුල තුළ සිදුවන වෙනස දරුවගේ අධ්‍යාපනයට ඉතාම වැදගත්. මේ තාක්ෂණික උපකරණ තුළ සිදුවන ක්‍රියාවන් පිළිබඳව දෙමාපියන් හොඳ අවබෝධයකින් සිටිය යුතු වෙනවා. එදා නිදහස් අධ්‍යාපනය මේ රටට හඳුන්වා දෙන විට අනාගතයේ සිදුවන වෙනස පිළිබඳව පැහැදිලි කර ඇත. එසේ නම් ඒ ගැන හිතන්න කාලය පැමිණ ඇත. රටට අවශ්‍ය විභාග කේන්ද්‍රිය අධ්‍යාපනයක් නොව ශිෂ්‍ය කේන්ද්‍රිය අධ්‍යාපනයක් ක්‍රියාවට නැන්වීමයි. තාමත් අපට නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කරගත යුතුයි. ඒ තුළ අධ්‍යාපන ජාතික ප්‍රතිපත්තියක් සකස් විය යුතුයි. මේ වන විට අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සඳහා යෝජනා සකස් කරමින් පවතිනවා. මේ සඳහා දෙමාපියන්, ආදිශිෂ්‍ය සංගම්, පාසැල් සංවර්ධන සමිති සහ සිවිල් සංවිධානවලින් යෝජනා ඉදිරිපත් කිරීම ඉතාම වැදගත් වෙනවා.

පින්ලන්තය වැනි දියුණු රටවල අධ්‍යාපන ක්‍රමයන් තුළ ඇති සාධනීය ලක්ෂණ අපේ රටට ගැළපෙන ආකාරයට සකස් කිරීමේ වරදක් නැහැ. නමුත් මේ සිදුවන වෙනස අධ්‍යාපන ක්ෂේත්‍රයේ ආයතන තුළ සිදුවන විට දී ඒ වෙනස සඳහා දෙමාපියන් සහ දරුවන්ගේ ශක්තිය පිළිබඳව ද අවබෝධයක් තිබිය යුතුයි. මේ වන විට අධ්‍යාපනය සඳහා රජයේ බදු මුදල් විශාල ප්‍රමාණයක් වැය කරනවා. රාජ්‍ය අය වැයෙන් මුදල් වෙන් කිරිමේ දී එහි ප්‍රතිශතය සෙසු ආයතන හා සැසැඳීමේ දී දෙවැනි තැන අධ්‍යාපනයට වැය කිරීමට සැලසුම් කරලා. ඒ වගේම දෙමාපියන් ද විශල මුදලක් වෙනම වැය කරනවා. රජය වැය කරන්නේත් දෙමාපියන් ලෙස වැය කරන්නේත් එකම පසුම්බියේ ඇති මුදල ක්‍රම දෙකකට වැය කරන බව අවබෝධ කරගත යුතුයි. ඒ වගේම ඒ තුළින් මේ රටට අවශ්‍ය නිර්මාණශීලී පුරවැසියන් ගුණ ගරුක පුරවැසියන් බිහි කිරීමත් මෙම අධ්‍යාපන ව්‍යුහය තුළ සිදුවිය යුතුයි. එකම පසුම්බියේ ඇති මුදල් දෙපාර්ශවයක් විසින් වැය කිරීමෙන් අවසන් ප්‍රතිඵලය රටට බිහි වන්නේ දුෂ්ඨයින්, මංකොල්ලකරුවන් පිරිසක් නම් අපේ අධ්‍යාපනයේ වෙනස පිළිබඳව සිතිය යුතුයි.

**දියුණු රටවල අධ්‍යාපනයේ වෙනස සාදා ඇත්තේ ඒ සඳහා ජාතික ප්‍රතිපත්තියක් රට තුළ ක්‍රියාත්මක කිරීමෙන් නමුත් අපේ රට තුළ අධ්‍යාපනයට ජාතික ප්‍රතිපත්තියක් නොමැති නිසා මේ වන විට පාසැල් දරුවා අසරණ තත්ත්වයට පත්වෙලා.**




මේ වනවිට අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ ආයතන ව්‍යුහයන් ගොඩනැගෙමින් පවතිනවා. රජයේ පාසැල් පද්ධතිය, පුද්ගලික පාසැල්, අමතර පංති පවත්වන ස්ථාන සහ පුද්ගලික පංති මේ සියල්ලම මහජන මුදල් වැය කරමින් සිදුවන කටයුතු මේ වන විට ඌව පළාතේ ලියා පදිංචි අමතර පංති පවත්වන ස්ථාන 182 ක් පළාත් පාලන ආයතන තුළ ලියාපදංචි වී තිබනවා. ඒ තුළ ගුරුවරු ලෙස සේවය කරන පිරිස 818 ක් රජයේ පාසැල්වලින් ලබන වඩා වැඩි වැටුපක් මාසිකව මෙම අමතර පංතිවලින් වැටුප් ලෙස ලැබේ. මීට අමතරව ජාත්‍යන්තර පාසැල් පද්ධයක්ද ක්‍රියාත්මක වේ. පහසුකම් සහිත විශාල කාර්යමණ්ඩලයන් මෙන්ම භෞතික සම්පත් විශාල ප්‍රමාණයක් මේ සඳහා මහජන බදු මුදල්වලින් වැය කරනු ලබයි. රටට අවශ්‍ය යහපත් ගුණගරුක නිර්මාණශීලී පුරවැසියන් නිර්මාණය කිරීම සඳහා මේ වැය කරන මුදල්වලින් ප්‍රතිඵලය ලබා ගැනීමට නම් දෙමාපියන් වශයෙන් පැවැරී ඇති වගකීම නිසි ලෙස ඉටු කිරීමට කාලය පැමිණ ඇත.

**වජිර උමගිලිය**

# මහත්මා ගාන්ධිතුමාගේ කවි සිතුවිල්ලක්

මහත්මා ගාන්ධිතුමා ජාතික වීරවරයෙකු, දේශ හිතෛෂියෙකු, සාමකාමී ලෙස සටන් මෙහෙයවන්නෙකු, නීතිඥයෙකු වශයෙන් ප්‍රසිද්ධියට පත් වුව ද කවියකු ලෙස ප්‍රසිද්ධියක් උසුලන්නේ නැත. ඔහු විසින් රචනා කළ බවට සැළකෙන මෙම කවි සිතුවිල්ල කියවා බලන්න.

## ඉටි පහන

දිනක් හිරු අවරට යාමට පෙර
තමා නික්ම ගිය පසු හිස්වන
තමාගේ සේවය භාරදීමට
කෙනෙකු සොයන්නට විය
පළමුව ඔහු සඳ ළඟට ගමන් කළේය
මා නික්ම ගිය පසු
මගේ සේවය බාරගැනීමට
ඔබට හැකිදැයි විමසිය
මා ඔබ තරම් බලසම්පන්න නැත
එබැවින්
එය භාරගැනීමට මට නොහැකි යයි
සඳේ පිළිතුර විය.

ඉන්පසු හිරු තරුවක් ළඟට ගමන් කළේය
පෙර පැනයම යොමු කරන ලදි
මා සඳටත් වඩා දුර්වල කෙනෙක්මි
එබැවින් මා කෙසේ එය භාරගනිම් ද
තරුවේ පිළිතුර විය.
ඉක්බිති හිරු
දැල්වෙන ඉටි පහනක් වෙත ගමන් කළේය
පෙර පැනයම විමසීමට ලක් කළේය
ඔව් මම භාර ගන්නම්
මගෙන් විමසීම පිළිබඳ මගේ ස්තුතිය පිළිගන්න

ඉටිපහනේ පිළිතුර විය
පසුදින උදෑසන නැවත පැමිණි හිරු
ඉටිපහන කළ සේවය විමසන්නට ඔහු ළඟට ගියේය
ඔව් උතුමාණෙනි
මා එය මගේ ශක්ති ප්‍රමාණයේ හැටියට කළා
පිළිතුර විය ඔබේ සේවය ඉතාම ප්‍රසංශනීයයි.
හිරු ඉටිපහනට ස්තුති කළේය.

# කෝ අපේ ළමා ලොව

දසමසකින් කුස දරලා බිහිකරලා
කිම ඔබ ගියේ දුරු රටකට ඉගිලීලා
මුළු සෙනෙහසම මිල මුදලට බිලිදීලා
මව්පියවරුනි ඇයි මේ ලෙස කුරිරුවෙලා

කරුණා දහර ගං කොමළිය සිඳුනිද ?
මෙත්තා දියර වට නියඟින් වියළී ද
කරුණා ගුණේ වෛරය වී දැල්වී ද
ආදර වදන් උඩු සුළඟට යා වීද

සියොළඟ දැවේ රැකවරණය නොලැබෙන්නේ
අදමිටු දනන් සිය ගුණයෙන් බිහි වන්නේ
මනුසත් දහම් සැම එක්වී වනසන්නේ
බුදුහිමියනේ අප කවුරුද රැකගන්නේ

නිදිමත දැනේ දෙනුවන් නැහැ පියවිලා
සෙල්ලම් පිටිය අද ගෙදරට පාළු වෙලා
හෙට ලොව දිනන දරුවන් යැයි නම් කරලා
පොත් ගොන්නකට අපේ ලෝකය සිරකරලා

සල්මල් වගේ දරුවන් කෙළෙසන්න එපා
මල් මල් වගේ සියුමැළි සිත් තලනු එපා
සල්පිල් වගේ ළමයින් විකුණන්න එපා
කඩපිල් වගේ සෙනෙහස දොර වසනු එපා

හැම වසරකම එක් දිනයක් වෙන් වෙන්නේ
දියතෙම ළමුන් ඒ දවසට එක් වන්නේ
යහගුණ සපිරි ලෝකයේ ඇති මිනිසුන්නේ
ලොව ඇති දූ පුතුන් පණ මෙන් සුරකින්නේ

සංකල්පනාව
මාධ්‍යවේදී රංජිත් ජයසුන්දර
බෝගමුව

# සෞන්දර්ය කලාව තුළින් සොඳුරු බුද්ධිමතුන් බිහි කරමු

මිහිමත සොඳුරු මිනිසුන්ගේ උපත සෞන්දර්ය කලාවයි. නිදහසේ සිටින මොහොතක ගලා එන පවන් රොදක නාදය අසමින් ගීතයක් මුමුණන්නට නිරායාසයෙන් ම දෙතොල් විවර වන්නේ එකී සෞන්දර්ය විඳගැනීමේ රිසියෙනි. අතීතයේ ජීවත් වූ අප පැරැන්නන් තුළ මෙකී සෞන්දර්ය කලාව උපතින් ම ගෙන ආ බවට සාක්ෂි වත්මන වන විටත් ඉතිරි වී පවතින හෙළ කලා නිර්මාණ තුළින් මොනවට පැහැදිලි වෙයි. සීගිරි බිතු සිතුවම්, ගල් කැටයම්, ප්‍රතිමා, ස්ථූප, මෙන් ම එදා මෙදා තුර අප රස විඳින මියුරු ස්වභාවිත ගීත ඉන් අතලොස්සක් පමණී. එදා තමා අවට ඇති වටපිටාව තුළින් ම අත්දැකීම් ගෙන සෞන්දර්ය කලාව ලොකු කුඩා මහළු සියලු දෙනාම රිසි සේ විඳ ගත්ත ද අද වර්තමානයේ දී ඉදිරි අනාගතය භාර ගැනීමට සිටින ශිෂ්‍ය ප්‍රජාව තුළින් මෙය ගිලිහී යන බව ඉතා පැහැදිලි ය. සමාජ පුරවැසියෙකු ලෙස පුහුණු කළ යුතු ඉවසීම, මානව දයාව, කරුණාව, මෛත්‍රිය වත්මන් පරපුර තුළින් ගිලිහී බොහෝ ගැටලු හමුවේ හදිසි තීරණ ගෙන වටිනා ජීවිත තොර කර ගන්නා තත්ත්වයට පත්ව සිටින්නේ මෙකී සෞන්දර්ය කලාව සිත් තුළ පෝෂණය වී නොමැති නිසාවෙනි.

වත්මන වන විට සෞන්දර්ය කලාවට පාසල් අධ්‍යාපනය තුළ ද තිබෙන සැළකිල්ල අඩු වෙමින් පවතින බව නොරහසකි. ගණිත, විද්‍යා, වාණිජ, තාක්ෂණ විෂයන් හමුවේ කලා විෂය ධාරාව වුව ද හදාරන දරුවන් ද උපකාරක පංතිවලට යොමු වී ප්‍රශ්න පත්‍රයට ම පමණක් ම පිළිතුරු සොයමින් ඒකාකාරී ජීවිතයකට හුරු වී සිටින්නේ සමාජය යන අතට හැඩ ගැසීමට සිදු වී ඇති නිසාවෙනි.

සෞන්දර්යකාමීව බුද්ධිය මෙහෙයවා කටයුතු කරන්නා ඉතා නිහඬ ය. එමෙන් ම ඉවසිලිවන්ත ය. නමුත් සමාජයේ එදිනෙදා හමු වන බුද්ධිමතුන්ගෙන් වැඩි පිරිසක් බුද්ධිය මෙහෙයවා පුළුල් දැනුම් පරාසයක් සහිතව කටයුතු කරන බව නොපෙනේ. එනම් ඔවුන් ප්‍රවීණත්වය ලබා සිටින්නේ එක විෂයකට හෝ දෙකකට හෝ කේන්ද්‍රීය වූ වපසරියක් තුළ ය. එය ගැටලුවක් ඇති වූ විට මෙන් ම තම බලය පෙන්වා අන් අය මෙල්ල කර ගැනීමට යාමෙන් හා අන් මත නොඉවසා තම මතයේ ම කටයුතු කිරීමෙන් මනාව පැහැදිලි වෙයි.

අන්මත ඉවසීමට හෝ තමාට ගරහන පුද්ගලයින් ඉදිරියේ නිහඬව සිටීම මදිපුංචිකමක් ලෙස බොහෝ දෙනා සැළකුව ද එය එසේ නොවීම නිසා අද පවුල් තුළ මෙන් ම සමාජය තුළ ද විශාල ලෙස ගැටලු ඇති වීමට හේතු වී තිබේ. මෙම කරුණු තේරුම් ගෙන නිවැරදි කර ගැනීම නම් පුළුල් සමාජ දැනුමක් පිළිබඳ සංවේදීතාවයක් තිබිය යුතු ම ය. එය මානව සිත් තුළ පෝෂණය කරනු ලබන්නේ පරිසරය හා සබැඳි සෞන්දර්ය කලාව යි.

කිසිදු අධ්‍යාපනයක් නොලැබූ පුද්ගලයින් පවා වටපිටාව තුළින් මෙකී සෞන්දර්ය ද ගැටලු හමුවේ සංවේදීව ක්‍රියාකරයි.

තරගකාරී අධ්‍යාපන රටාවකට හුරු වී සිටින ශිෂ්‍ය ප්‍රජවට පරිසරය ඇසුරු කොටගෙන අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව නැති වී ගොස් පංති කාමරයකට ඔවුන් කොටු වී ඇත. ඔවුන්ට අධ්‍යනයට ලැබෙන විෂය කිහිපය පමණක් ඔස්සේ කරුණු සොයමින් හැල්මේ දුවයි. අධ්‍යාපන කටයුතු අතරතුර පොතක් පතක් කියවීමට, ගීතයක් රස විඳීමට, පරිසරයේ අසිරිය විඳ ගනිමින් චිත්‍රයක් ඇඳීමට හෝ අඩු තරමින් මව පියා පවුලේ අය සමඟ එකතු වී ආහාර ගැනීම වත් දරුවන්ට ඇති ඉඩ ප්‍රස්ථාව ඇහිරී යමින් පවතී.

තමන් ඉදිරියට එන විවිධ අභියෝග හමුවේ නිදහසක් නොමැතිව ලැබුවා වූ අධ්‍යාපනය මගින් පිළිතුරු සෙවීමට ප්‍රයත්න දැරීම මීට කදිම නිදසුනකි. එසේ ම ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු ලිවීමේ දී පොතපතේ පමණක් ම අන්තර්ගත කරුණු ඉදිරිපත් කරමින් පිළිතුරු ලිවීමට උත්සාහ දරන දරුවා ඉන් ඔබ්බට ගොස් වෙනත් මානයකින් එම පිළිතුර නිර්මාණශීලීව ඉදිරිපත් කිරීමට පෙළඹෙනු දක්නට නොමැති තරම් ය.

එසේ නම් නිවැරදි විය යුත්තේ පවතින අධ්‍යාපන ක්‍රමය යි. කුඩා මනසට සැහැල්ලුවෙන් සිටීමට මද කාලයක් හෝ වටිනාකමකින් යුක්තව පරිසරය හා ගැටෙමින් විඳීමට ඉඩ ලබා දිය යුතු ය. විභාග පසු පසම හබා යන අතරමඟ මදක් හෝ නැවතී විඩාව හැර නැවත ගමන් ආරම්භ කිරීමට අවස්ථාව සළසා දිය යුතු ම ය. නැතහොත් අවසන හැඟීම් දැනීම් නොමැති ඉවසීම, මෛත්‍රිය, කරුණාව, දයාව, සහකම්පනය නොමැති රොබෝවරුන් පිරිසක් බිහි වනු නිසැක ය. එම බේදවාචකයට දරුවන් ගොදුරු නොකර තම අදහස් හා හැඟීම් පරිසරය හා සෞන්දර්ය කලාව සමග බෙදා ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලබා දිය යුතු ය. එය ඔවුන්ගේ ජීවිතවල කොටසක් බවට ද පත් කළ යුතු ය. එවිට ජීවිතයට එන අභියෝග හමුවේ නොසැලී මුහුණ දීමටත් අන් අය සමග සහයෝගයෙන් කටයුතු කිරීමෙන් සුහදතාව වර්ධනය කොටගෙන ගැටලු හමුවේ කෙන්ද කන්දක් නොකරගෙන කටයුතු කිරීමටත්, අපූර්වත්වයෙන් යුතු කලා නිර්මාණ බිහි කිරීමටත්, ඉගෙනුම් කාර්යය පීඩාවකින් තොරව අවබෝධයෙන් හා උද්යෝගයෙන් මෙන් ම ආශාවෙන් සිදු කිරීමටත් හැකි වන සොඳුරු බුද්ධිමතුන් පිරිසක් ලක් මව තුරුලේ බිහි වනු ඇත.

**පී.එම්. මුදිතා රුවන්මලී පතිරාජ**

**'සහන' ආබාධිතයින් සඳහා වූ සංගමය -නොච්චියාගම.**

# අධ්‍යාපන සංවර්ධන සන්ධානය සාමාජික සංවිධාන හා එක්ව ලෝක ළමා දිනය/ ගුරු දිනය සහ සාක්ෂරතා දිනය මහත් ඉහළින් සමරනු ලබයි.

ශ්‍රී ලංකාවේ ලෝක ගුරු දිනය සමරනු ලබන්නේ සෑම වසරකම ඔක්තෝබර් 5 වනදා ය. රටේ දරුවන් යහපත් පුරවැසියන් කිරීමේ භාරදූර මෙහෙවරක් කරනු ලබන ගුරුභවතුන් ඇගයීම සහ ඔවුන්ගේ පුරෝගාමී මෙහෙවර පිළිබඳව සමාජය දැනුම්වත් කිරීම අරමුණු කරගෙන ලෝක ප්‍රජාව විසින් ලෝක ගුරු දිනය සමරනු ලබයි. මෙවර එහි තේමාව වනුයේ "ඉගැන්වීමේ නිදහස සහ ගුරුවරුන් සවිබල ගැන්වීම" යන්නය. ලෝක ළමා දිනය සැමරීම සඳහා ලෝකයේ රටවල් වර්ෂයේ එක් එක් දින තෝරාගෙන ඇති අතර ශ්‍රී ලංකාව එය සමරනු ලබන්නේ ඔක්තෝබර් 01 වැනි දාය. මෙවර එහි තේමාව වූයේ "මාපිය වැඩිහිටි සෙනෙහස රඳවමු. සොඳුරු ලොවක් වෙත දරුවන් කැඳවමු" යන්නයි. ඒ අනුව ලෝක ළමා දින තේමාව සමස්ත සමාජයටම ඇරයුම් කරනු ලබන්නේ ළමා ලොව සුරක්ෂිත කිරීමේ කාර්යභාරය වෙනුවෙනි. දිවයිනේ සෑම පාසලකම ලෝක ළමාදින සැමරුම් උත්සව පැවැත්වීම ශ්‍රී ලංකාවේ වාර්ෂිකව සිදු වේ. එමෙන්ම ජාත්‍යන්තර සාක්ෂරතා දිනය ද යෙදෙනුයේ සෑම වසරකම සැප්තැම්බර් 08 වනදාය.

අධ්‍යාපනය සම්බන්ධයෙන් වැදගත් වන මෙම දිනයන් සැමරීම සඳහා ඔක්තෝබර් මාසයේ දී අධ්‍යාපන සංවර්ධන සන්ධානය විසින් සාමාජික සංවිධාන හා එක්ව වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව ලෝක ළමා දිනය වෙනුවෙන් ඔක්තෝබර් මාසයේදී ප්‍රධාන වශයෙන් ප්‍රාදේශීය ගුවන් විදුලි සේවයන් ඔස්සේ ළමා දින වැඩසටහන් පවත්වන ලදී. ඌව පළාත, දකුණු පළාත සහ වයඹ පළාතේ පිහිටා ඇති ප්‍රාදේශීය සහ ප්‍රජා ගුවන් විදුලි සේවාවන් වන ඌව ප්‍රජා ගුවන් විදුලිය, රුහුණු සේවය, රන්ගිරි දඹුලු සේවය සමගින් මෙම වැඩසටහන් ක්‍රියාත්මක විය.

වැඩසටහන් මෙහෙයවීම අදාළ පළාත්වල සාමාජික සංවිධානවල සහාය ඇතිව පළාත් සම්බන්ධීකාරකවරුන් විසින් සිදුකරන ලදී. මීට අමතරව ළමුන්ගේ ක්‍රියාකාරකම් ඇගයීමේ වැඩසටහන් සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් ද පවත්වන ලදී. අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ වයඹ පළාත් ජාලය විසින් ලෝක ගුරු දිනයට සමගාමීව "අගයමු - පසසමු" තේමාව යටතේ ගුරුවරුන් ඇගයීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. "විශේෂයෙන්ම ගෝලීය තිරසර සංවර්ධන අරමුණු 04 වන "සැමට ගුණාත්මක, සමාන අන්තර්කරණ අධ්‍යාපන ප්‍රවේශයක් සහතික කිරීම මෙන්ම යාවජීව ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කරනබ අවස්ථා සැපයීම" 2030 වන විට ජයගත යුතුය. මෙම අරමුණු ළඟා කර ගැනීමේ ගාමක බලවේගය ලෙස ශ්‍රී ලංකාවේ සමස්ත ගුරු පරපුරත්, ඔවුන් මෙහෙයවන අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරි කණ්ඩායමත් හැඳින්වීම අසාධාරණ නොවනු ඇත. ඒ නිසාම මෙම කණ්ඩායම් දෙක අගය කිරීම මගින් සිදුවන්නේ ඔවුන්ගේ හැකියාවන්ට හා කැපවීමට වටිනාකමක්, අගයක් ලබා දීමය" යනුවෙන් අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සභාපති වන කේ. ඩී. පීරිස් මහතා ප්‍රකාශ කරන ලදී. ඒ අනුව "අගයමු-පසසමු" තේමාව යටතේ සංවිධානය කරන ලද මෙම ගුරු උපහාර වැඩසටහන මගින් ගුරුවරුන් සඳහා උපහාර තිළිණ සහ ගෞරව සහතික ප්‍රධානය කිරීමද සිදුකරන ලදී.

අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ නැගෙනහිර පළාත් ජාලය විසින් "ළමා අපයෝජනය සහ ළමා ආරක්ෂණ නීති සම්බන්ධයෙන්" දෙමව්පියන, ගුරුවරුන් සහ දරුවන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක්" ලෝක ළමා දින සැමරුම වෙනුවෙන් පවත්වන ලදී. සියලු දෙනාට ගුණාත්මක සහ සමාන අවස්ථා සහිත අධ්‍යාපනයක් ලබා දීමට කැප වී ක්‍රියාකරන අධ්‍යාපන සංවර්ධන සන්ධානය විසින් සංවිධානය කරන ලද මෙම සියලු සැමරුම් උත්සව සාමාජික සංවිධානවල ධාරිතාව ශක්තිමත් කිරීම මෙන්ම 2030 තිරසර අධ්‍යාපන අරමුණු ජයගැනීමේ අරමුණින් සංවිධානය කරන ලදී.







# තිරසර සංවර්ධන අරමුණු අංක 4 පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවක් සංවිධානය කරනු ලබයි

පසුගිය වසරේ සැප්තැම්බර් මාසයේදී පැවති එක්සත් ජාතීන්ගේ සමුළුවේදී ලෝක නායකයින් ජගත් මානව ප්‍රජාවේ සුභසාධනය වෙනුවෙන් සකසන ලද්දා වූ තිරසර සංවර්ධන අරමුණු දිනාගැනීම සඳහා කටයුතු කිරීමටත් එකඟත්වය පළකළහ. මෙම තිරසර සංවර්ධන අරමුණු එකිනෙක හා බැඳුණු අරමුණු 17 කින් සහ ඉලක්ක 169 කින් සමන්විත විය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂ මැදිහත්වීම යටතේ ලෝකයේ රටවල් තිරසර සංවර්ධන අරමුණු න්‍යාය පත්‍රය කරා එළැඹුණේ වසර 2000 සිට 2015 දක්වා ක්‍රියාත්මක වූ සහශ්‍ර සංවර්ධන අරමුණු ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය පිළිබඳව සිදු කරන ලද සමාලෝචනයකින් අනතුරුවය. නව තිරසර සංවර්ධන අරමුණු එකිනෙක එකිනෙකට සුවිශේෂී මෙන්ම එකිනෙක හා බද්ධ වී තිබේ. මෙම අරමුණු දිනාගැනීම සඳහා වඩාත් පුළුල් මට්ටමේ ප්‍රවේශයක් අවශ්‍ය වන්නේ මේ නිසාය. මේ අනුව මෙම අරමුණු දිනාගැනීමේ දී රාජ්‍ය අංශය, රාජ්‍ය නොවන අංශය සහ පෞද්ගලික අංශය ඇතුළුව සමාජයේ සියලුම කොටස් සහ පුද්ගලයන් මේ සම්බන්ධයෙන් දැනුම්වත් වීමත් ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වීමත් ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකා රජය මෙම අන්තර්ජාතික සම්මුතිය ක්‍රියාවට නැංවීම සඳහා පියවර ගනිමින් සිටියි. තිරසර සංවර්ධන අරමුණු දිනාග නිමේදී වැදගත් වන්නා වූ ක්‍රමෝපායික සැලසුම් සකස් කිරීම ආයතන අතර සම්බන්ධීකරණය පවත්වාගෙන යාම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කිරීමට 2015 සැප්තැම්බර් මාසයේදී තිරසර





සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශය පිහිටුවනු ලැබීය. කෙසේ වෙතත් තිරසර සංවර්ධන අරමුණු හා ඒවා දිනා ගැනීමට පවතින වැඩපිළිවෙල ගැන මෙන්ම පුද්ගලිකව ඒ වෙනුවෙන් කළයුතු කැපවීම සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාව තුළ පමණක් නොව මේ සම්බන්ධයෙන් මූලික වගකීමක් දරණ රාජ්‍ය නිලධාරීන් තුළ පවා පැහැදිලි අවබෝධයක් නොතිබෙන බව අනාවරණය වී තිබේ.

මෙම තත්ත්වයට යම් විසඳුමක් ලබාදීම සඳහා තිරසර සංවර්ධන අරමුණු පිළිබඳවත් විශේෂයෙන්ම අධ්‍යාපනික අරමුණ පිළිබඳව දෙමව්පියන් සහ ගුරුවරුන් දැනුම්වත් කිරීමටත් අධ්‍යාපන සංවර්ධන සන්ධානය විසින් වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. දිස්ත්‍රික් 18 ක පවත්වන ලද මෙම වැඩසටහන් සම්බන්ධීකරණය සහ මෙහෙයවීම සිදුකරන ලද්දේ අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් විසිණි. ගුරුවරුන් සහ දෙමව්පියන් සඳහා පවත්වන ලද මෙම දැනුම්වත් කිරීමේ වැඩසටහන් සඳහා පළාත් අධ්‍යාපන බලධාරීන්, විදුහල්පතිවරුන් මෙන්ම මාධ්‍යවේදීන් ද සිටියහ. මෙම දැනුම්වත් කිරීමේ වැඩසටහන්වලදී සහශ්‍ර සංවර්ධන අරමුණුවල සිට තිරසර සංවර්ධන අරමුණු කරා පරිනාමනය වූ ක්‍රියාවලිය පිළිබඳව සහභාගිකයන්ට මනා අවබෝධයක් ලබා දීමට කටයුතු කරන ලදී. විශේෂයෙන්ම අධ්‍යාපන අරමුණු අංක 04 සියලුදෙනා අන්තර්කරණය වූ සමානාත්මතාවයෙන් යුත් ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම හා අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම සඳහා සිවිල් පුරවැසියන් සහ සංවිධානවල මැදිහත් වීමේ අවශ්‍යතාවය පිළිබඳව අවධාරණය කරන ලදී.

- තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව දනුම්වත්භාවය ඉහළ නැංවීමත් අදාළ අංශ සඳහා වූ විශේෂ සැළසුම් ක්‍රියාවට නැංවීමේ දී කොටස්කරුවන් බවට පත්වීමට ඔවුන් උනන්දු කරවීම
- අපගේ පාර්ශව සංවිධානවල ධාරිතාවන් ශක්තිමත් කිරීම සහ ඔවුන් අධ්‍යාපන ක්ෂේත්‍රය සමග පවත්වන්නා වූ සම්බන්ධතාවන් තවදුරටත් ශක්තිමත් කිරීම
- අදාළ ප්‍රදේශයන්හි අධ්‍යාපනය සම්බන්ධයෙන් පවත්නා ගැටළු හඳුනා ගැනීම සහ ඒවා විසඳා ගැනීමට ක්‍රමෝපායන් හඳුනා ගැනීම

මෙම දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ මූලික අරමුණු විය. එමෙන්ම පවතින අධ්‍යාපන ගැටලු පිළිබඳව ද දෙමව්පියන් විසින් අදහස් ඉදිරිපත් කරන ලදී. තිරසර අධ්‍යාපන අරමුණු ජය ගැනීමට නම් එම අධ්‍යාපන ගැටලු ජයගත යුතු බවද ගුරු දෙගුරුන්ගේ අදහස විය. පාසල් වැසීයාම, අධ්‍යාපනය පෞද්ගලීකරණය වීම, ගුරු හිඟය ආදී ගැටලු සම්බන්ධයෙන් ද දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී.

අදාළ ප්‍රදේශයන්හි අධ්‍යාපන බලධාරීන් ද මෙම අවස්ථාවට සහභාගී වූ බැවින් පළාත් අධ්‍යාපනය සම්බන්ධයෙන් ඔවුන් හා සෘජුව අදහස් හුවමාරු කර ගැනීමට කදිම අවස්ථාවක් මෙමගින් උදා වූ බව මෙම වැඩසටහන පිළිබඳව අදහස් දක්වමින් සහභාගිකයන් පවසා සිටියහ. එමෙන්ම තිරසර සංවර්ධන අරමුණු දිනා ගැනීම සාමූහික ක්‍රියාවලියක් බවත් ඒ සඳහා පුද්ගලයන් තනි තනි වශයෙන් මෙන්ම සාමුහුකව ක්‍රියාත්මක විය යුතු බවත් සහභාගිකයන්ට අවබෝධ කරලීම මෙම වැඩමුළුව මගින් හැකි විය.






# අධ්‍යාපන සංවර්ධන සන්ධානය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා වූ සිවිල් සමාජයීය යෝජනා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාට පිළිගන්වනු ලබයි

අධ්‍යාපන සංවර්ධන සන්ධානය අධ්‍යාපන ක්ෂේත්‍රයේ කටයුතු කරන සිවිල් සමාජ සංවිධාන 57 ක පමණ කණ්ඩායමක් සමග සහභාගිත්ව ප්‍රවේශයක් උපයෝගී කරගෙන සකස්කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේදී අවධානය යොමු කළයුතු කරුණු පිළිබඳ යෝජනාවලියක් පසුගිය 11 වැනිදා අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සභාපති කේ.ඩී පීරිස් මහතා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත පිළිගන්වනු ලැබිණි.

සමස්ථ ලංකා ගුරුවරුන්ගේ සංගමය, විශ්‍රාමික අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරීන්ගේ සංගමය හා අධ්‍යාපන සංවර්ධන සන්ධානය විසින් ලෝක ගුරු දිනය සැමරීම වෙනුවෙන් සංවිධානය කරන ලද උත්සවයක දී මෙම යෝජනාවලිය පිරිනැමීම සිදු වූ අතර මෙම අවස්ථාවට අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ ලේකම්තුමා සහ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්ද සහභාගී වූහ. 2030 වසරේ දී ලඟාකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අතරින් අධ්‍යාපන අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා හා ශ්‍රී ලංකාවට උචිත ජාතික අධ්‍යාපන වැඩසැලැස්මක් සැකසීමේදී සැළකිල්ලට ගත යුතු කරුණු පිළිබඳව සංවාදාත්මක වැඩමුලු කිහිපයක් පවත්වන ලදී. එම වැඩමුලුවල කණ්ඩායම් ක්‍රියාකාරකම් සහ සැසිවාරවල සාකච්ඡා වූ අදහස් හා යෝජනා කරුණු 60 ක් පමණ සංඛ්‍යාවක් පාදක කරගෙන මෙම යෝජනා සකස් කර තිබේ.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ අධ්‍යාපනය සම්බන්ධ ජාත්‍යන්තර සම්මුති, අධ්‍යාපන පද්ධතියේ විකාශයේ යහභාවිතයන්, මෙතෙක් බලපවත්වා ඇති අධ්‍යාපන අණපනත්, රෙගුලාසි ආදිය ගැනද සැලකිලිමත් වෙමින් අධ්‍යාපන මූලධර්මවලට පටහැනි නොවන ලෙස මූලික අධ්‍යාපනය ප්‍රතිපත්තියක් පිළිබඳව ජාතික එකගතාවයකට එළඹිය යුතු බව මෙහිදී මූලික වශයෙන් යෝජනාවී තිබේ

එමෙන්ම දැනට පවතින විෂයමුලික බුද්ධිඵලය කේන්ද්‍ර කරගත් පාඨමාලා, ඉගැන්වීම් ක්‍රම සහ ඇගයීම් ක්‍රම සංශෝධනය විය යුතුය. සමාජ ආකල්පවල ප්‍රගතිශීලි වෙනස්කම්වලට මූලිකත්වය ලබාදිය හැකි සමාජ හා පරිසර හිතකාමි ජීවන නිපුනතාවලින් හෙබි අනාගත පුරවැසියන් නිර්මාණය කිරීම සඳහා විචාරශීලි බව, සංවේදිතාව,ගැටලු විසඳීම, විශ්ලේෂණය, ආරම්භකත්වය,



සාමූහිකත්වය, විනයගරුක බව වැනි චිත්තවේගී ඉගෙනුම් ඵලයට වැඩිබරක් ගෙන දෙන ගුණාංග ගොඩනැංවීමට අධ්‍යාපන ක්‍රියාවලියේ දී මූලික වශයෙන් අවධානය යොමුවිය යුතු බවට ඉදිරිපත් කරන ලද යෝජනාව කාලීන වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවත්නා බරපතළ ගැටලුවලට විසඳුම් ලබාදීමත් රටේ ආර්ථික සංවර්ධනය සහ සමාජ සුභසිද්ධිය ඇතිකරලීම සඳහා මග පාදන යෝජනාවක් බව මෙහිදී සඳහන් කළ හැකිය.

කොළඹ තර්ස්ටන් විද්‍යාලයීය ශ්‍රවණාගාරයේදී පැවැති මෙම උත්සවයට අධ්‍යාන අමාත්‍යාංශ නිලධාරීන් සිවිල් සංවිධාන නියෝජිතයින් ගුරුවරුන් සහ පෙර පාසල් ගුරුවරුන් සහ සිසුන් ඇතුලු විශාල පිරිසක් සහභාගී වූහ.

මෙහිදී අදහස් දැක් වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා නිදහස් අධ්‍යාපනය තහවුරු කිරීමට වර්තමාන රජය විසින් වැදගත් පියවර ගණනාවක් දැනටමත් රැගෙන ඇති බවටත් නව ක්‍රියාමාර්ග රැසක් ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව පැවසීය. අධ්‍යාපනය රජය විසින් නොමිලයේ ලබාදෙන නමුත් අධ්‍යාපනය සඳහා රජය විසින් වැය කරනු ලබන මුදලට සමාන හෝ ඊට වැඩි මුදලක් තම දරුවන් වෙනුවෙන් දෙමාපියන් වැයකරන බව ඔහු පෙන්වා දුන්නේය. මේ අධික වියදම් අඩුකරලීම සඳහා මෑතකදී ක්‍රියාත්මක කරන ලද සුරක්ෂා රක්ෂණය සුවිශේෂී ස්ථානයක් ගන්නා බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සුනිල් හෙට්ටිආරච්චි මහතා මේ අවස්ථාවේදී සඳහන් කළේය. නව තාක්ෂණය අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන බවත් මේ යටතේ විද්‍යුත් පෙළ පොත් සහ පරිගණක ලබාදීම ලබන වසරේ සිට ආරම්භ කරන බව ඔහු පැවසීය. ළමුන්ට හිතකාමී නව තාක්ෂණයෙන් හෙබි පන්ති කාමර සැකසීමට කටයුතු කරන බවත් ගුණාත්මක අධ්‍යාපනය නංවාලීම සඳහා ගුරු පුහුණු ආයතන සඳහා වෙන්කරනු ලබන සම්පත් ප්‍රමාණය කැපීපෙනෙන ලෙස ඉහළ නංවන බවත් එතුමා සඳහන් කළේය. එමෙන්ම විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය තුළින් සිසුන් දෙමාපියන් අසීමාන්තික තරගකාරිත්වයකට යොමුවී සිටින බවත් එමගින් ළමුන් මහත් පීඩාවකට ලක්වීම මෙන්ම අධ්‍යාපනය සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවී ඇතැයි ද අනාගතයේ සිදුකරන්නා වූ සංශෝධනයක් තුළින් මෙම දුර්වලතා මගහැර වඩාත් කුසලතා සම්පන්න සිසු පරපුරක් බිහිකිරීමට මගපාදනු ඇති බවට ඔහු විශ්වාසය පළ කලේය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෙනස්කම් සිදුකිරිමේ දී සියලු දෙනාගෙන් අදහස් විමසීමෙන් සහ සහභාගිත්වයෙන් එම තීරණ ගත යුතු බවත් එබැවින් මෙම සිවිල් සංවිධාන යෝජනා ඉතා වැදගත් වන බව ඔහු සඳහන් කළේය.

මෙහිදි අදහස් දක්වූ සමස්ථ ලංකා ගුරු සංගමයේ සභාපතිනි ඇන්ජලා විජේසිංහ මහත්මිය පැවසුයේ ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා ගුණාත්මක බවෙන් උසස් ගුරුවරුන් අවශ්‍ය වන බැවින් ඒ සඳහා විශේෂ අවධානය යොමු කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතින බවත්ය.

විශ්‍රාමික අධ්‍යාපන පරිපාලන සේවා සංගමයේ උපදේශක ප්‍රේමසිරි වැලිවිට මහතා අදහස් දක්වමින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වඩාත් වැදගත් වන්නේ ගුරුවරු සිසුන් සහ දෙමාපියන්ගේ සම්බන්ධතාවය බවත් ඔවුන්ගේ අදහස් දැක්වීම්වලට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් යහපත් ප්‍රතිචාර දැක්වීම ඉතා අගය කළ යුතු කරුණක් බව පැවසීය. මෙම හමුවීම නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක පෙරළිකාරී ආරම්භයක් සනිටුහන් කරන වැදගත් පියවරක් වනු ඇතැයි පැවසූ වැලිවිට මහතා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා අත්දැකීම් බහුල ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥයින්ගේ සේවය ලබාදීමට සැමවිටම සූදානමින් සිටින බවද සඳහන් කළේය.

**අධ්‍යාපන සංවර්ධන සන්ධානය**
**අංක 439/6A සුදර්ශන මාවත. නාවල පාර, රාජගිරිය**
**Web: cedsrilanka.net**
**දුරකතනය : 0112887642**